සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**අවසාන විභාගය - 2012 ජනවාරි**

2012-01-22
පස්වරු
[2.00 – 5.00]

# (61) විගණනය

Auditing

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 04
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  - *(1) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු ය.***
  - *(2) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාලව, **එක් භාෂාවකින්** පමණක්, ඔබ වෙත සපයන ලද **පොත්වල** උත්තර ලියන්න.*
  - *(3) ගණක යන්ත්‍ර භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - *(4) ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත් ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
  - *(5) ලකුණු 100.*

---

**01.** (a) විගණනයක ප්‍රාථමික අරමුණ (primary objective) කුමක්ද? (ලකුණු 02)

(b) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකයන් සඳහා වන වෘත්තීය චර්යාව හා ආචාරධර්ම සංග්‍රහයේ ඇති මූලික මූලධර්ම හතරක්(04) දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) "විගණකයෙක් ඔහු විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මත නියත තහවුරුවක් (absolute assurance) ලබා නොදේ." එසේ විගණකට ඔහු විසින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ මත නියත තහවුරුවක් ලබා දිය නොහැකි වන්නේ ඇයි දැයි යන්නට හේතු හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

(d) අභ්‍යන්තර විගණකයෙකු විසින් ඉටු කරන ක්‍රියාකාරකම් හතරක්(04) දක්වා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(e) ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ බලතල දෙකක්(02) දක්වන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 18)

**02.** (a) පරිගණක ගතකළ විද්‍යුත් දත්ත සැකසුම් පද්ධතියක භාවිත පාලන (යෙදුම් පාලන) ස්ථාපනය කළ යුත්තේ ඇයිදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

(b) පරිගණක ගතකළ විද්‍යුත් දත්ත සැකසුම් පද්ධතියක ස්ථාපනය කළ හැකි භාවිත පාලන තුනක්(03) එකිනෙක සඳහා උදාහරණයක් සහිතව සඳහන් කරන්න. (ලකුණු 03)

(c) පහත සඳහන් දෑ වලින් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) පාලන අවදානම (Control Risk).

(ii) අනාවරණ අවදානම (Detection Risk). (ලකුණු 04)

(d) **සීමාසහිත සිග්මා සමාගම** වායු සමීකරණ යන්ත්‍ර ආනයනය කර විකුණන අතර එහි කාර්යාලය රත්මලානේ පිහිටා ඇත. වායු සමීකරණ යන්ත්‍ර ණය පදනම මත මෙන්ම අත්පිට මුදල් ගෙවීමේ පදනම මතද විකුණනු ලැබේ. ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ඇණවුම් ගබඩා භාරකරු වෙත ඉදිරිපත් කරන අතර ඔහු විසින් ඉන්වොයිස් නිකුත් කර ගනුදෙනුකරුවන්ගේ මුදල් / චෙක්පත් බාර ගනී. ආරක්ෂක නිලධාරියා විසින් ඉන්වොයිසියේ සඳහන් විස්තර ගනුදෙනුකරුට නිකුත් කරන භාණ්ඩ සමග එකඟ වේදැයි යන්න පරීක්ෂා කරනු ලැබේ. ණය පදනම මත වායු සමීකරණ මිලදී ගන්නා ගනුදෙනුකරුවන් ඔවුන්ගේ ණය කාලය අවසානයේ අදාල මුදල් / චෙක්පත් සහකාර ගණකාධිකාරීවරයාට බාර දෙයි. දිනය අවසානයේදී සහකාර ගණකාධිකාරීවරයා විසින් ඉන්වොයිස් හා මුදල් එකතු කර විකුණුම් සාරාංශයක් පිළියෙල කර මුදල් ඊළඟ වැඩ කරන දිනයේදී බැංකුවේ තැන්පත් කරයි. සහකාර ගණකාධිකාරීවරයා විසින්ම මුදල් පොත යාවත්කාලීන කර (updates) බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළියෙල කරයි.

(i) ඉහත විස්තර කරන ලද අභ්‍යන්තර පාලන ක්‍රමයේ වැදගත් දුර්වලතා තුනක්(03) හඳුනා දක්වන්න. (ලකුණු 03)

(ii) ඔබ මෙම දුර්වලතා මග හරවා ගන්නා ආකාරය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කරගන්නා ආකාරය කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 18)

**03.** (a) විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණකයෙකුට ඉටුකළ හැකි විගණන පටිපාටින් හතරක්(04) සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(b) වරලත් ගණකාධිකාරීවරුන්ගේ විගණන ආයතනයක් විසින් ක්‍රියාත්මක කරන තත්ත්ව පාලන ප්‍රතිපත්ති වල අරමුණු හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

(c) ඔබ **සීමාසහිත තරු පොදු සමාගමේ** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ විගණනය බාරව කටයුතු කරන කණ්ඩායමේ සාමාජිකයෙකි. එහි දේපල, පිරියත හා උපකරණ සත්‍යාපනය කරන ලෙස ඔබෙන් ඉල්ලා ඇත. සමාලෝචනය කරන අතරතුර 2010/11 මුදල් වර්ෂය තුලදී සමාගමට අයත් ගොඩනැගිල්ලක් ප්‍රත්‍යාගණනය කර ඇති බවත්, ප්‍රත්‍යාගණන අතිරික්තය වූ රු. මිලියන 100 ක් සමාගමේ ගිණුම් පොත්වල සටහන් කර ඇති බවත් ඔබට දැකගත හැකි විය.

**ඔබ විසින්**, ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමට අදාල වාර්තාවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය නිශ්චය කිරීම සඳහා ඔබ විසින් සලකා බලන සාධක හතරක්(04) සඳහන් කළ යුතුය. (ලකුණු 04)

(d) ඔබ, **සීමාසහිත රත්මුතු (පෞද්.) සමාගමේ** මූල්‍ය ප්‍රකාශ විගණනය කරනු ලබන විගණන කණ්ඩායමේ සාමාජිකයෙකි. ඔබගේ ජ්‍යෙෂ්ඨ විගණක විසින් වෙළෙඳ ගෙවිය යුතු ගිණුම් සත්‍යාපනය කිරීමේ කාර්යය ඔබට පවරා ඇත.

**ඔබ විසින්,** 2011 මාර්තු 31 දිනට හිඟව ඇති වෙළෙඳ ගෙවිය යුතු ගිණුම් සත්‍යාපනය කිරීම සඳහා ඉටු කරනු ලබන වැදගත් විගණන පටිපාටින් පහක්(05) ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 17)

**04.** (a) වැටුප් හා වේතන විගණනය කිරීමේදී පහත සඳහන් එක් එක් සැදහුම (assertions) සඳහා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස ඔබ විසින් ඉටු කළ යුතු එක් විගණන පටිපාටියක් බැගින් දක්වන්න.

(i) සිදුවීම (Occurrence).

(ii) සම්පූර්ණත්වය (Completeness).

(iii) නිරවද්‍යතාව (Accuracy).

(iv) වෙන් කිරීම (Cut-off). (ලකුණු 04)

(b) පහත සඳහන් තොරතුරු **සීමාසහිත XYZ සමාගමේ** 2011 මාර්තු 31 දිනට ගිණුම් වාර්තා වලින් උපුටා ගන්නා ලදි.

| | **රු.** (මිලියන) |
|---|---|
| බැංකු ණය | 20 |
| ස්ථාවර තැන්පතු | 5 |
| අසම්භාව්‍ය බැරකම් සඳහා වෙන් කිරීම | 6 |

**ඔබ විසින්,** ඉහත එක් එක් අයිතමය සත්‍යාපනය කිරීම සඳහා විගණකයෙකු විසින් සිදු කරනු ලබන තහවුරු පටිපාටි / පරීක්ෂාවන් දෙක(02) බැගින් ලැයිස්තුගත කරන්න. (ලකුණු 06)

(c) "මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක වූ කරුණු පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි සාධාරණ වශයෙන් පවතී යැයි අපේක්ෂා කළ නොහැකි අවස්ථාවල විගණක කළමනාකරණයෙන් ලිඛිත නියෝජනයන් ලබා ගත යුතුය".

**ඔබ විසින්,** සාමාන්‍යයෙන් අස්තිත්වයක කළමනාකරණය විසින් කළමනාකරණ නියෝජන ලිපියක ඇතුළත් කරනු ලබන කරුණු හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 14)

**05.** (a) විගණන සේවාදායකයෙකු සම්බන්ධයෙන් අදාල වන එකී ව්‍යාපාරයේ ස්වභාවය හා අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබා ගැනීම සඳහා විගණකයෙක් ඉටු කරනු ලබන විගණන පටිපාටින් හතරක්(04) සඳහන් කරන්න. (ලකුණු 04)

(b) විගණකයෙකුට තත්ත්වාගනනය කළ විගණන මතයක් ප්‍රකාශ කිරීමට සිදුවන තත්ත්වයන් (circumstances) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(c) ඔබ, **සීමාසහිත සුපර්ලයිට් (පෞද්.) සමාගමේ** 2011 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂයේ තොග භෞතික ගණන් ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා පත් කරන ලද විගණන කණ්ඩායමේ සාමාජිකයෙකි. පහත සඳහන් දෑ ඔබට නිරීක්ෂණය වී ඇති අතර ඒවා වැඩ පත්‍රිකා වල වාර්තා කර ඇත.

| අයිතමය | මැනුම් ඒකකය | තොග ලෙජරය අනුව ශේෂය | භෞතික ශේෂය | අතිරික්ත (ඌනතා) | අදහස් දැක්වීම් |
|---|---|---|---|---|---|
| සුපර් ලයිට් සබන් ග්‍රෑම් 100 | ඇසුරුම් | 1,100 | 1,100 | - | මෙම අයිතමය නිකුත් නොවන අයිතමයක් ලෙස හඳුනාගෙන ඇති අතර 2008 සිට විකුණුම් කර නැත. |
| සුපර් ලයිට් සබන් ග්‍රෑම් 200 | ඇසුරුම් | 500 | 600 | 100 | - |
| සුපර්වයිට් දත් බෙහෙත් ග්‍රෑම් 100 | ඇසුරුම් | 500 | 600 | 100 | දත් බෙහෙත් ඇසුරුම් 100 ක් කල් ඉකුත් වී ඇති අතර ඒවා අනෙකුත් තොග වලින් වෙන්කර තබා ඇත. |
| සුපර්වයිට් දත් බෙහෙත් ග්‍රෑම් 200 | ඇසුරුම් | 850 | 850 | - | - |
| සුපර්වයිට් බේබි ක්‍රීම් ග්‍රෑම් 150 | ඇසුරුම් | 500 | 100 | (400) | - |

**ඔබ විසින්,** ඉහත සඳහන් තොරතුරු වලින් විගණනයේදී විශේෂ අවධානය යොමුවිය යුතු කරුණු (issues) හතරක්(04) හේතු සහිතව හඳුනා දක්වන්න. (ලකුණු 06)
(මුළු ලකුණු 14)

**06.** (a) 2007 අංක 07 දරණ සමාගම් පනත ප්‍රකාරව සමාගමක **ප්‍රථම** විගණකවරයා පත් කිරීම කළ යුත්තේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(b) සමාගම් පනතේ 157 (3) වගන්තිය ප්‍රකාර සමාගමක විගණනවරයෙකු ලෙස පත්කළ නොහැකි පුද්ගලයන් තිදෙනෙකු(03) නම් කරන්න. (ලකුණු 03)

(c) 2007 අංක 07 දරණ සමාගම් පනතේ 163 වැනි වගන්තිය අනුව කොටස් හිමියන්ට නිකුත් කරන විගණකවරයාගේ වාර්තාවේ විගණකවරයා විසින් අඩංගු කළ යුතු කරුණු තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(d) සීමාසහිත වගකීම් සහිත සමාගමක විගණකවරයෙකු සතු අයිතිවාසිකම් හෝ බලතල තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

(e) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයාගේ කාර්යය/කර්තව්‍යයන් තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

(f) (i) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ii) එහි කාර්යයන් / කර්තව්‍යයන් දෙකක්(02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 19)

- o0o -